# ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2021

## නිතර අසන ප්‍රශ්න සහ පිළිතුරු

01. 2021 ඡන්දහිමි නාම ලේඛන සකස් කිරීමේදී ගෙයින් ගෙට BC පත්‍රයක් වෙනදා මෙන් බෙදා දෙනු ලබයි ද?

පිළිතුර :- නැත

දිවයින තුළ පවතින Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වර්ෂයේ දී වෙනදා මෙන් නිවෙස්වලට BC පත්‍ර බෙදාදීමක් සිදු නොකෙරේ.

02. එසේ බෙදාදීමක් සිදු නොකරයි නම් ජනතාවගේ නම් ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් කරගන්නේ කෙසේ ද?

පිළිතුර :- ඒ සඳහා පහත ක්‍රියාමාර්ග ගත යුතුයි.

I. ඔබගේ නම 2020 ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී ඇත්දැයි යන්න www.elections.gov.lk වෙබ් අඩවියෙන් හෝ ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් පරීක්‍ෂා කර බලන්න.

II. ඔබගේ නම 2020 නාමලේඛනයේ තිබෙ නම් ඔබ විසින් කිසිදු අයදුම්පත්‍රයක් පිරවීමට අවශ්‍ය නොවේ. ඔබගේ නම 2020 ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ලිපිනයේ ම 2021 වර්ෂයේද ලියාපදිංචි කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලැබේ.

03. යම් පුද්ගලයෙකු තම පදිංචිය වෙනස් වීම හේතුවෙන් ලියාපදිංචි ලිපිනය වෙනස් කිරීමට කළයුත්තේ කුමක් ද?

පිළිතුර :- ඔබගේ පදිංචිය 2021 ජුනි මස 01 දිනට පෙර වෙනස් වී ඇත්නම් පමණක් 2021 ඡන්දහිමි නාමලේඛනයේ නව ලිපිනය යටතේ ලියාපදිංචි විය හැක. ඒ සඳහා ඔබ දැනට පදිංචි ලිපිනයට අදාල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයා හමුවී 2021/ER ආකෘති පත්‍රයක් ඉල්ලා ගෙන එය සම්පූර්ණ කර භාරදිය යුතුය. මෙම ආකෘතිය www.elections.gov.lk වෙබ් අඩවියන් ද බාගත කර හැකිය. මෙම ආකෘතිය ඔබගේ පූර්ව පදිංචි විස්තර සඳහන් කිරීමට ඇති තීරුවෙහි එම විස්තර අනිවාර්යයෙන් සටහන් කිරීමට වගබලා ගන්න. පූර්ව පදිංචි ස්ථානයෙන් පදිංචිය හැරයාමට අදාළව ග්‍රාම නිලධාරීවරයා විසින් නිකුත් කරන ලද ලිපියක් ගෙන ඒම අනිවාර්යය නොවේ.

04. යම් පුද්ගලයෙකුගේ නමක් 2020 නාමලේඛනයේ නොමැති නම් එම තැනැත්තන්ගේ ඡන්දය ලියාපදිංචි වන්නේ කෙසේ ද?

පිළිතුර :- ඉහත සඳහන් පරිදි ග්‍රාම නිලධාරීවරයා හමු වී 2021/ER ආකෘතියක් ලබාගෙන හෝ www.elections.gov.lk වෙබ් අඩවියන් ද භාගත කරගෙන අදාළ ආකෘතිය නියමිත පරිදි සම්පූර්ණ කර භාර දෙන්න. මෙම ආකෘතියෙ හි ඔබ අවසන් වරට ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටි ලිපිනයෙහි විස්තර සටහන් කිරීමට කටයුතු කරන්න.

05. වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන් ලියාපදිංචි කරන්නේ කෙසේ ද?

පිළිතුර :- 2021 නාමලේඛනයට ලියාපදිංචිවීමට හැක්කේ 2003.05.31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන්ට පමණයි. ඒ අනුව 2021/ER ආකෘතියක් සම්පූර්ණ කර ග්‍රාම නිලධාරීවරයා වෙත භාර දෙන්න.

06. මෙම ලියවිලි ග්‍රාම නිලධරිවරයා වෙත භාරදිය යුතු අවසන් දිනය කවදා ද?

පිළිතුර :- සම්පූර්ණ කරන ලද 2021/ER ආකෘතිය, ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකයේ පිටපත් ඇතුළු අදාල ලියවිලි වල (අවස්ථානුකූලව විවාහ සහතිකය, පදිංචිය හැරයෑම් ලිපිය) පිටපත් සමග 2021 ජුලි මස 15 දින හෝ ඊට පෙර භාර දෙන්න.

07. මෙම සියලු ලේඛන ලැබුණු පසු ඔබගේ නම ඡන්දහිමි නාමලේඛනයේ කෙටුම්පතට ඇතුළත් වී ඇත්දැයි පරීක්‍ෂා කර බලන්නේ කෙසේ ද?

පිළිතුර :- ඇතුළත් වන හා ඉවත් වන නම් ග්‍රාම නිලධාරි කාර්යාලවල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ප්‍රදර්ශනය කරනු ලැබේ. එමෙන්ම www.elections.gov.lk වෙබ් අඩවියේ එම විස්තර ප්‍රදර්ශණය කරනු ඇත. මෙම ප්‍රදර්ශනය කරනු ලබන දිනයන් ඉදිරියේ දී ප්‍රසිද්ධ දැන්වීම් මඟින් හා ඔබගේ ජංගම දූරකථනයට එවනු ලබන SMS පණිවිඩයක් මඟින්ද දැනුම්දෙනු ලබයි.